# මුතුහරක පැහැසර

## මෙල්බන් රූපවාහිනී මුතුහර ළමා සමාජයේ ප්‍රසංගය

මෙල්බන් වේදිකාව මත විවිධාකාර වූ ප්‍රසංග අපි නරඹන්නෙමු. එහෙත් ළමා වේදිකාව මත පෙළගැසෙන ප්‍රසංගයක් නරඹන්නට ලැබීම සැමවිටම සතුටට කරුණක් වන්නේ මෙවන් වූ දේශයක එවන් දසුන් විරළ බැවින් ය. පසුගිය දා අප දුටු මෙල්බන් මුතුහර ළමා සමාජයේ ප්‍රසංගයද එවන් වූ ප්‍රසංගයකි.

අප බොහෝ විට ලියා ඇතුවා සේ ළමා ප්‍රසංගයක් යනු පහසුවෙන් සංවිදානය කළ නොහැකි මහත් වෙහෙසක් දරා සංවිදානය කළ යුතු ප්‍රසංගයකි. ඒ වෙනුවෙන් කළ යුතු කැපවීම අපට තේරුම් ගන්නට හැකි ය. එවන් වෙහෙසක් දරා මෙවන් ප්‍රසංගයක් සංවිධානය කිරීම සැමගේ පැසසුමට හේතුවන කාරණයකි. ප්‍රසංගයෙ පසුපස සිටි දෙමාපියන්ටත් සංවිධායිකා වත්සලා ඉෂ්ඨවීරටත් ඒ පැසසුම හිමිවෙයි.

මුතුහර ප්‍රසංගයේ දරුවන්ගේ රංගනය පිලිබඳව බොහෝ ලිවිය හැකි ය. රංගනය ය්දී ඔවුන් පෑ දක්ෂතාව ප්‍රසංගය නැරඹූ සැමට බොහෝ කලකට අමතකව නොයනු ඇති බව සැබෑ ය. මේ දරුවන් මේ සා දක්සාවක් දක්වන්නට කෙතරම් කැපවීමකින් පුහුණුවන්නට ඇතිද යන්න අමුතුවෙන් පැහැදිලි කළ යුතු නැත. ඒ කැපවීම විශේෂයෙන් අගය කල යුතු ය.

ප්‍රසංගයේ සංගීතය අපූරු ය. විශේෂයෙන් සජීවී සංගීතය ට දරුවන් කළ ගායනා කැපී පෙනුණි. පටිගත කළ සංගීතයට කෙරෙන වැඩිහිටි ප්‍රසංග පවා නරඹන යුගයක සජීවී සංගීතයෙන් යුතු ළමා ප්‍රසංගයක් නරඹන්නට ලැබීම භාග්‍යයකි. ගායනා ඉදිරිපත් කළ සියලුම දරුවෝ පැසසුම් ලැබිය යුත්තෝ ය.

ප්‍රසංගය සඳහා වැඩිහිටි රංගන ශිල්පීන් ලෙස දායක වූ සියල්ලන්ම සිය කාර්යය මනා ලෙස ඉටු කළ බව පෙනුණි. චින්තක සිරිකුමාර වැනි දක්ෂතා ඇති රංගන ශිල්පීන්ගේ සහය ලබාගෙන තිබීම ප්‍රසංගයේ සාර්ථකත්වයට බෙහෙවින් බලපෑ බව පෙනෙයි.

පසුතල නිර්මාණ ආලෝක නිර්මාණ ඇඳුම් නිර්මාණ වැනි සියලුම අංග කෙරෙහි දක්වා තිබූ සැළකිල්ල වැදගත් ය. විශේෂයෙන් ළමා ප්‍රසංගයක වර්ණවත් බව වැඩි දියුණු කරන්නේ මේ අංග යි. මුතුහර ප්‍රසංගයේ සංවිදායකයන් ඒ වෙනුවෙන් දක්වා තිබූ උනන්දුව ප්‍රසංගයේ විචිත්‍රවත් බව වැඩි දියුණු කරන්නට ඉවහල් විය.

සමස්ථයක් වශයෙන් සාර්ථක ප්‍රසංගයක් යනු ඒ පසුපස සිට වෙහෙස මහන්සිවන විශාල පිරිසකගේ සාමූහික ප්‍රයත්නයක සාර්ථකත්වයයි. ඒ වෙනුවෙන් ඒ සියලු දෙනාටම අපේ පැසසුම හිමිවෙයි.

**ජගත් ජේ එදිරිසිංහ**







